# PUBLIC ECONOMY
# (Part-VIII)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# සැපයුම් පාර්ශවයේ ප්‍රතිපත්ති

සැපයුම් පාර්ශ්වයේ ප්‍රතිපත්ති යනු සූක්ෂ්ම ආර්ථික විද්‍යාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති වන අතර ඒවා මගින් අපේක්ෂා කරනුයේ වෙළෙඳපොළ ආර්ථිකයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම තුළින් ආර්ථික වෘද්ධිය වේගවත් කිරීම යි.

සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන විට ආයෝජනය වැඩි වීම සහ නිෂ්පාදන පිරිවැය අඩු වී නිෂ්පාදන සාධකවල ඵලදායිතාව ද වැඩි වීමට හේතු වේ.

ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන් අපේක්ෂිත මට්ටම් කරා ගෙන ඒමට සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තිය මගින් කටයුතු කරනු ලැබේ.

ClassWork.LK

# සැපයුම් පාර්ශ්වයේ ආර්ථික ප්‍රතිපත්තිවල උපකරණ

සැපයුම් පාර්ශ්වයේ ආර්ථික ප්‍රතිපත්තිවල උපකරණ කිහිපයකි.

- බදු ප්‍රතිසංස්කරණ
- පෞද්ගලීකරණය
- නියාමනාහරණය
- ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ
- ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ

ClassWork.LK

## බදු ප්‍රතිසංස්කරණ

නිෂ්පාදනය ඉහළ නැංවීමට අනුබලයක් ලැබෙන සේ බදු ක්‍රමයෙහි වෙනස්කම් ඇති කිරීම බදු ප්‍රතිසංස්කරණ ලෙස හැඳින්වේ.

වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වයට බදු අය කිරීම මගින් යම් යම් බලපෑම් ඇති කරනු ලබයි.

බදු හේතුවෙන් නිෂ්පාදනයේ පරිභෝජනයේ ආයෝජනයෙන් ඉතිරි කිරිම්වලත් ප්‍රශස්ත මට්ටමට ළඟා විය නොහැකි වේ.

ClassWork.LK

# ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණය

ශ්‍රම වෙළෙඳපොළ ඇති දෘඪතාවන් ඉවත් වන ආකාරයෙන් ශ්‍රම ඉල්ලුම හා ශ්‍රම සැපයුම සම්බන්ධයෙන් වෙනස්කම් ඇති කිරීම ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණය ලෙස හැඳින්වේ.

**නිදසුන් :**

- ✓ පීඩාකාරී කම්කරු නීති ඉවත් කිරීම
- ✓ තරඟකාරී ශ්‍රම වෙළෙඳපොළක් බිහි කිරීම
- ✓ ඒ ඒ වෘත්තීන් සඳහා පුහුණු වීම් පිළිබඳව දැනුම්වත් කිරීම

අඩු සුදුසුකම් ඇති වෘත්තිමය සේවකයින් බඳවා නොගැනීම ආදිය යම් කිසි සීමාවකට යටත් ව අහිතකර ප්‍රතිවිපාක අවම වන ආකාරයට යොදා ගත යුතු වේ.

ClassWork.LK

ශ්‍රම වෙළෙඳපොළ සම්බන්ධයෙන් කම්කරු හා වෘත්තීය සමිති සම්බන්ධතා අමාත්‍යාංශය විසින් වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී.

එනම්,

- සේවකයන්ගේ අවම ජාතික වේතන පනත යටතේ 2016 සිට අවම වැටුප රු. 10 000 ක් ලෙස නීතිගත කිරීම,
- විදේශ රැකියා සඳහා යන අයගේ ශිල්පීය නිපුණතා වර්ධනය කිරීමේ වැඩ සටහන් සැකසීම,
- මැද පෙරදිග හැර වෙනත් කලාප ඉලක්ක කර ගැනීම තුළින් ශ්‍රම වෙළෙඳපොළක් ඇති කර ගැනීම,
- ශ්‍රමිකයන් පුහුණු කිරීම ආදී වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම යනාදියයි.

ClassWork.LK

# පෞද්ගලීකරණය

රජයේ හිමිකාරිත්වය යටතේ පැවති ව්‍යාපාර පෞද්ගලික අංශයට විකිණීම, බදු දීම, කළමනාකරණය පමණක් පැවරීම පෞද්ගලීකරණය යනුවෙන් හැඳින්වේ.

## පෞද්ගලීකරණයේ හිතකර ප්‍රතිඵල

ඒ තුළින් පහත සඳහන් හිතකර තත්ත්වයන් ළඟා කර ගත හැකි ය.

- වඩාත් ඵලදායි ලෙස නිෂ්පාදන සම්පත් නිෂ්පාදන කටයුතුවලට යෙදවීමෙන් නිෂ්පාදනය සාර්ථක වීම
- රාජ්‍ය ඒකාධිකාරය අහෝසි වී තරගකාරී වෙළෙඳපොළක් බිහි වීම
- නිෂ්පාදිතවල ගුණාත්මක තත්ත්වය ඉහළ යාම
- ප්‍රාග්ධන හිඟයට පිළියමක් වීම
- ව්‍යාපාරවලට කෙරෙන දේශපාලන බලපෑම් ඉවත් වීම

ClassWork.LK

ශ්‍රී ලංකාවේ පසුගිය දශක කිහිපය තුළ රාජ්‍ය හිමිකාරිත්වය යටතේ පැවති රාජ්‍ය සංස්ථා රාජ්‍ය සමාගම් පෞද්ගලීකරණය තුළින් ඉහත කරුණ අපේක්ෂා කෙරෙණි.

එමගින් සාර්ථකත්වයක් ලැබූ ආයතන මෙන් ම අකාර්යක්ෂම වූ ආයතන ද දක්නට විය.

## නියාමනහරණය

ආර්ථිකයට තරගකාරීත්වය අඩු වීමට බලපාන නීතියෙන් පනවන ලද හා සමාජීය ලෙස ඇති වී තිබෙන රෙගුලාසි හා බාධා ඉවත් කිරීම නියාමනහරණයයි.

**නිදසුන් :**

- ව්‍යාපාරයක් ආරම්භ කිරීම සම්බන්ධ ව පවතින දැඩි නීතිරීති ලිහිල් කිරීම
- නිදහස් වෙළෙඳාමට බාධා වන ආකාරයේ රජයේ දැඩි අධීක්ෂණය අඩු කිරීම

ClassWork.LK

# ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණය

නිෂ්පාදන ඉහළ නංවා ගැනීම සඳහා බාධාවක්ව පවතින ප්‍රාග්ධන හිඟය විසඳාගත හැකි ආකාරයට කටයුතු කිරීම ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණය ලෙස සැලකිය හැකි ය.

**නිදසුන් :**

- ✓ ප්‍රාග්ධනයේ ඵලදායිතාව ඉහළ නැංවීම
- ✓ සෘජු විදේශ ආයෝජන දිරිමත් කිරීම
- ✓ සහනදායි කොන්දේසි මත විදේශ ණය ලබා ගැනීම
- ✓ ඉතිරි කිරීම් වැඩි දියුණු කිරීමට කටයුතු කිරීම

පසුගිය වසර කිහිපය තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළෙහි ප්‍රාථමික වෙළෙඳුන්ගේ ව්‍යාපාර ශීඝ්‍රයෙන් ප්‍රසාරණය වූව ද මෙහෙයුම් කටයුතුවල සුළු කාර්ය සාධනයක් පෙන්නුම් කරන ලදි.

ClassWork.LK

ඉහත ප්‍රතිසංස්කරණ තුළින් ආයෝජන වැඩි වී නිෂ්පාදනය ඉහළ යාම හිතකර තත්ත්වයක් වේ. එසේ ම අහිතකර තත්ත්වයන් ද උදා විය හැකි ය.

**නිදසුන් :**

- ✓ විදේශ ආයෝජන වැඩි කිරිම තුළින් ලාභ හා ලාභාංශ විදේශ රටවලට ඇදී යාම
- ✓ විදේශ ණය ලබා ගැනීම නිසා ණය වාරික හා පොලිය ලෙස විශාල මුදල් වැය වීම.
- ✓ රාජ්‍ය වර්තන වියදම් අඩු වීම සමාජ ශුභසාධනයට අහිතකර වීම

සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිසංස්කරණ ලෙස ඉහත ප්‍රතිසංස්කරණයන් යොදා ගැනීමේ දී අහිතකර ප්‍රතිඵල අවම වන අන්දමට යොදා ගත යුතු වේ.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550


S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura